ඉදා ජාඅ නස්රුල්ලාහි වල් ෆත්හු” (අන්-නස්ර්: 1) නම් පරිච්ඡේදය පහළ වීමෙන් පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතයේ දී “සුබ්හානකල්ලාහුම්ම රබ්බනා වබිහම්දික අල්ලාහුම්මග් ෆිර්ලී”

මුඃමින්වරුන්ගේ මාතාව වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඉදා ජාඅ නස්රුල්ලාහි වල් ෆත්හු” (අන්-නස්ර්: 1) නම් පරිච්ඡේදය පහළ වීමෙන් පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතයේ දී “සුබ්හානකල්ලාහුම්ම රබ්බනා වබිහම්දික අල්ලාහුම්මග් ෆිර්ලී” යනුවෙන් ප්රකාශ කිරීමෙන් මිස සලාත් ඉටු කළේ නැත. එතුමිය විසින් වාර්තා කළ තවත් හදීසයක “අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) එතුමාණන්ගේ රුකූඃහි හා එතුමාණන්ගේ සුජූද්හි එතුමාණෝ “සුබ්හානකල්ලාහුම්ම රබ්බනා වබිහම්දික අල්ලාහුම්මග් ෆිර්ලී” යනුවෙන් අධිකව පවසා සිටියහ." යැයි සඳහන්ව ඇත. [صحيح] [متفق عليه]

"ඉදා ජාඅ නස්රුල්ලාහි වල් ෆත්හු” (අන්-නස්ර්: 1) නම් පාඨය පහළ කරනු ලැබූ කල්හි, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එය අධ්යයනය කළ අතර "ෆසබ්බිහ් බිහම්දි රබ්බික වස්තඃෆිර්හු" (ඔබ ඔබේ පරමාධිපතියාණන්ගේ ප්රශංසාව තුළින් පිවිතුරු කරනු. ඔහුගෙන් සමාව ඉල්ලා සිටිනු.) යන ප්රකාශය ඇති අල්ලාහ්ගේ නියෝගය පිළිපදින්නට යුහුසුළු වූ බවත් සලාතය අතරවාරයේ එතුමාණන්ගේ රුකූඃ හා සුජූද් ඉරියව්වන්හි "සුබ්හානල්ලාහ්" (ඔබට සුදුසු නොවන සියලුම අඩුපාඩුවලින් ඔබව මම සුවිශුද්ධ කරමි.) "අල්ලාහුම්ම රබ්බනා වබිහම්දික" (ඔබේ පැවත්ම, ඔබේ ගුණාංග හා ඔබේ ක්රියාවන්හි පරිපූර්ණත්වය වෙනුවෙන් ඔබට හිමි ප්රශංසාව තුළින්) "අල්ලාහුම්මග් ෆිර්ලී” (මාගේ පාපයන් මගෙන් මකා දමනු මැනව! මගෙන් ඉවත් කරනු මැනව!) යැයි අධිකව ප්රාර්ථනා කරන්නට වූහැ"යි ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය දන්වා සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/5212